විශේෂ සටහන 14

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග: 2019[1]

### මුදල් ප්‍රතිපත්තිය

| | | |
|---|---|---|
| 2019 පෙබරවාරි 22 | - | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2019 මාර්තු 01 දිනෙන් ආරම්භ වන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි සියයට 6.00 සිට සියයට 5.00 දක්වා ප්‍රතිශතාංක 1.00කින් අඩු කරන ලදී. |
| 2019 මැයි 31 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.50 සහ සියයට 8.50 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. |
| 2019 අගෝස්තු 23 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.00 සහ සියයට 8.00 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. |
| 2020 ජනවාරි 30 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 7.50 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.25 සහ සියයට 7.25 දක්වා පදනම් අංක 25කින් අඩු කරන ලදී. |
| | - | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2020 මාර්තු 16 දිනෙන් ආරම්භ වන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි සියයට 5.00 සිට සියයට 4.00 දක්වා ප්‍රතිශතාංක 1.00කින් අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 03 | - | 2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, සියයට 6.00 සහ සියයට 7.00 දක්වා අඩු කරන ලදී. |

### මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

| | | |
|---|---|---|
| 2019 ජනවාරි 04 | - | විදේශ සේවකයින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල සේවයේ යෙදීම සඳහා අදාළ මාර්ගෝපදේශ පිළිබඳව දැනුවත් කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කළ අතර, මේ සම්බන්ධයෙන් කලින් නිකුත් කළ චක්‍රලේඛය අවලංගු කරන ලදී. |
| 2019 ජනවාරි 18 | - | බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික හා ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් හෙළිදරව් කිරීම් ප්‍රකාශන සම්බන්ධයෙන් නව ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නව ආකෘති හඳුන්වා දෙමින් සහ ඒ සම්බන්ධ දැනට පවතින ආකෘති භාවිතයෙන් ඉවත් කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2019 මාර්තු 07 | - | මෝටර් වාහන ආනයනය සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා පනවා තිබූ අවම මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතා ඉවත් කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2019 මාර්තු 13 | - | ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි මත සිදු කරන ආනයන සඳහා වන ආන්තික අවශ්‍යතා පිළිබඳ වූ චක්‍රලේඛය අහෝසි කරන ලදී. |
| | - | මූල්‍ය සේවාවන්හි ස්වභාවය වෙනස් කරමින් ලොතරැයි/දිනුම් ඇදීම් සහ ත්‍යාග ලබා දීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. තවද, උත්සවකාලීන හෝ ප්‍රවර්ධනමය ත්‍යාග ලබාදීමේ ක්‍රමවේද සම්බන්ධ කොන්දේසි ද බලපත්‍රලාභී බැංකු වෙත දන්වන ලදී. |
| 2019 අප්‍රේල් 18 | - | සහනදායී කොන්දේසි මත මෝටර් රථ ආනයනය කිරීම සඳහා වන තීරුබදු බලපත්‍ර පදනම් කරගනිමින් ණයවර ලිපි විවෘත කිරීමේ දී පැවති සීමා ඉවත් කරන ලද බව දන්වමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

1 2019 වසර තුළදී සහ 2020 අප්‍රේල් 03 වන දිනෙන් අවසන් වන සතිය දක්වා වන කාලය තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් හා ක්‍රියාමාර්ග මෙන්ම නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ. 2019 දෙසැම්බර් 01 වන දින සිට 2020 අප්‍රේල් 01 වන දින දක්වා කාලය තුළදී රජය විසින් නිවේදනය කරන ලද සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පාර්ලිමේන්තු අනුමැතියට යටත් වේ.

| | |
|---|---|
| 2019 අප්‍රේල් 26 | - බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි හෝ ගෙවිය හැකි උපරිම පොලී අනුපාතික නියම කරමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී ඉතිරි කිරීමේ තැන්පතු, කල් පිරීමේ කාලය මාස තුනට අඩු වෙනත් තැන්පතු හෝ කල් පිරීමේ කාලයක් සඳහන් නොවන තැන්පතු සඳහා වන පොලී අනුපාතිකය නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය මත ද, මාස තුන හා ඊට වැඩි කාලීන තැන්පතු සඳහා වන පොලී අනුපාතිකය දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය මත ද පදනම් වේ. |
| | - SLFRS 9 ප්‍රමිතියට අනුගත වීමේ දී 2019 ජනවාරි 01 සිට 2020 ජුනි 30 දක්වා වන අන්තර් කාලයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබා දෙන ණය පහසුකම් වැඩි කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව දන්වමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | - බාසල් III රාමුව යටතේ ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීම සඳහා වන නියාමන අවශ්‍යතා දැනුම්දීම පිණිස බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2019 මැයි 08 | - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හෝ සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ සේවා සපයන ඕනෑම අධිකාරියක හෝ නියෝජිතායතනයක ලියාපදිංචි වී ඇති පුද්ගලයන් සහ ආයතන සඳහා, වෙන වෙනම සලකා බැලීමේ පදනම මත, 2019 අප්‍රේල් 18 දිනට පැවති ණය පහසුකම් (ප්‍රාග්ධනය සහ පොලිය) සම්බන්ධයෙන් ණය පියවීම සඳහා 2020 මාර්තු 31 දක්වා සහන කාලයක් ලබා දීමේ හැකියාව ලබා දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2019 මැයි 31 | - 2018 අංක 01 දරන බැංකු පනත් විධානය සංශෝධනය කරමින්, සැහැල්ලු ට්‍රක් රථ සඳහා වන වටිනාකම මත ණය පහසුකම් අනුපාතය සියයට 70 සිට සියයට 90 දක්වා වැඩි කරමින් බැංකු පනත් විධානයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2019 ජුනි 28 | - "ව්‍යවසායී ශ්‍රී ලංකාවක්" වැඩසටහන යටතේ කුඩා කුලී රථ සහනදායී ණය යෝජනා ක්‍රමය මගින් මිලදී ගනු ලබන ලියාපදිංචි නොකළ විදුලි නොවන මෝටර් රථ සඳහා සියයට 80 ක වටිනාකම මත ණය පහසුකම් ලබා දීමට හැකි පරිදි බලපත්‍රලාභී බැංකුවලට බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2019 ජූලි 18 | - බාසල් III රාමුව යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධ 2016 අංක 01 දරන බැංකු පනත් විධානයට අනුව ප්‍රාග්ධනය සහ අවදානම් මත බර තැබූ වත්කම් ගණනය කිරීමේ අනුකූල බව තහවුරු කිරීමේ අරමුණින් බාසල් III රාමුව යටතේ ඇති ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, නව ගිණුම්කරණ ප්‍රමිතියට (SLFRS 9) අනුගත කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේ සටහනක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| | - 2018 අංක 12 දරන බාසල් III රාමුව යටතේ බලපත්‍රලාභී බැංකු සඳහා තෝලන අනුපාතය සම්බන්ධයෙන් බැංකු පනත් විධානයේ අර්ථ නිරූපණ සම්බන්ධ පැහැදිලි කිරීමේ සටහනක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2019 අගෝස්තු 29 | - ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල වෙළඳපොළ හැසිරීම සහ භාණ්ඩාගාර මෙහෙයුම් සම්බන්ධයෙන් බැංකු පනත් විධානයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. මෙම විධානය තුළ වෙළඳපොළ හැසිරීම සහ ආචාරධර්ම පරිචයන්, රහස්‍ය අවශ්‍යතා, ගනුදෙනු සංවාද පටිගත කිරීමේ ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ මූලධර්ම, වෘත්තීයභාවය සහ දැනුම, විධාන සමග අනුකූල නොවීම පිළිබඳ සම්බාධක ආදිය ඇතුළත් වේ. |
| 2019 සැප්තැම්බර් 05 | - 2019 සැප්තැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හට ප්‍රතිවිකුණුම් පදනම මත "ද්‍රවශීලතා ආධාරක පහසුකම" හඳුන්වා දීමට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | - 2019 සැප්තැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි විවට වෙළඳ කටයුතු යටතේ ස්ථිර පදනම මත සිදු කරන වෙන්දේසිවලදී භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීමේ/විකිණීමේ හැකියාව ලබා දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | - 2019 සැප්තැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි විවට වෙළඳ කටයුතු යටතේ ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර මිලට ගැනීම්/විකිණීම් සඳහා සහභාගී වීමට, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ට අවස්ථාව ලබා දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2019 සැප්තැම්බර් 24 | - | බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාතිකය සම්බන්ධයෙන් වන 2019 අංක 01 දරන මුදල් පනත් නියෝගය ඉවත් කරන ලදී. |
| | - | මෑතකාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ, වෙළඳපොළ ණය පොලී අනුපාතික වෙත සම්ප්‍රේෂණය වීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මුදල් පනත් නියෝගයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. ඒ අනුව සියලු බලපත්‍රලාභී බැංකු රුපියල් ණය සහ අත්තිකාරම් පොලී අනුපාතික ඉලක්කගත දිනවල දී අඩු කළ යුතු වේ. තවද, ණය පත්, පූර්ව අනුමත කරන ලද තාවකාලික අයිරා (temporary overdrafts) සහ හිඟ කාලසීමාවන්ට අදාළ හිඟ ගෙවීම් මත දඩ පොලී අනුපාතික සඳහා සීමා හඳුන්වා දෙන ලදී. |
| 2019 නොවැම්බර් 18 | - | 2021 ජනවාරි 01 දින සිට ආරම්භ වන මූල්‍ය වර්ෂ සඳහා අදාළ වන පරිදි, බලපත්‍රලාභී බැංකුවල ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරුන්ගේ නව ලැයිස්තුව ප්‍රකාශයට පත් කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2019 දෙසැම්බර් 19 | - | 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යථායෝග්‍යතාවය තක්සේරු කිරීම පිළිබඳ බැංකු පනත් විධානයක් නිකුත් කරන ලද අතර, එම කරුණු අතරට, දිවුරුම් ප්‍රකාශ සඳහා පුළුල් තොරතුරු ඇතුළත් නව ආකෘතීන් හඳුන්වාදීම සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් ලෙස නිර්ණය කරනු ලබන තනතුරු පුළුල් කිරීමද අයත් වේ. |
| | - | මෙයට පෙර බැංකු අංශයෙහි අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරීන් ලෙස පත් කරනු ලැබූ පුද්ගලයන් ශ්‍රී ලංකාවේ කිසියම් බලපත්‍රලාභී බැංකුවක තම ධූරයෙහි කටයුතු අවසන් වීමෙන් අනතුරුව, මාස 6 ක කාල සීමාව ඉක්මවීමට (Cooling Off Period) පෙර නැවත පත් කිරීම වළක්වාලීමට බලපත්‍රලාභී බැංකුවලට නියම කරමින් ආයතනික යහපාලනය පිළිබඳ දැනට පවතින බැංකු පනත් විධානයන් සංශෝධනය කරන ලදී. |
| | - | බලපත්‍රලාභී බැංකු වල නිශ්චල දේපළ තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව පිළිබඳ දැනට පවතින බැංකු පනත් විධානයන් සංශෝධනය කරන ලද අතර, එසේ සංශෝධිත අංශ අතර තක්සේරුකරුවන්ගේ යෝග්‍යතා නිර්ණායක, තක්සේරු කරන වාර ගණන සහ අභ්‍යන්තර තක්සේරුකරණය සඳහා අදාළ අවම සීමා ඇතුළත් වේ. |
| 2019 දෙසැම්බර් 20 | - | අන්තර්ජාතික යහභාවිතාවන්ට අනුකූලව දේශීය පද්ධතිමය වශයෙන් වැදගත්කමක් ඇති බැංකු සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය පිළිබඳ නව රාමුවක් හඳුන්වා දෙමින් සහ නව රාමුවට අනුකූලව බලපත්‍රලාභී බැංකු හතරක් දේශීය පද්ධතිමය වශයෙන් වැදගත්කමක් ඇති බැංකු ලෙස නිර්ණය කරමින්, බැංකු පනත් විධානයන් නිකුත් කරන ලදී. මේ අනුව, දේශීය පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු ලෙස නිර්ණය කරනු ලබන බලපත්‍රලාභී බැංකු, සියයට 1-2 අතර පරාසයක් සහිත, ඉහළ අලාභ අවශෝෂණය පිළිබඳ ප්‍රාග්ධන අවශ්‍යතා සහිත කාණ්ඩ 3කට වෙන් කරනු ලබන අතර, මෙම ප්‍රාග්ධන අවශ්‍යතාව පළමු පෙළ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය මගින් සපුරාලිය යුතුය. |
| 2020 ජනවාරි 30 | - | සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැනුම්කරුවන්ට ණය ආධාර සැපයීම සඳහා විශේෂ ණය ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 01 | - | අපනයන ආදායමෙන් අපනයන ණය පහසුකම් පියවීම සඳහා ගතවන උපරිම කාලය නැව්ගත කළ දින සිට දින 180ක් දක්වා දීර්ඝ කරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 19 | - | ණයවර ලිපි යටතේ තෝරාගත් මෝටර් වාහන ආනයනය කිරීම සහ ණයවර ලිපි, ප්‍රතිග්‍රහණ ලියවිලි හා අත්තිකාරම් ගෙවීම් යටතේ තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම මාස තුනක කාලයක් සඳහා අත්හිටුවන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම ද මාස තුනක කාලයක් සඳහා අත්හිටුවන ලදී. |
| 2020 මාර්තු 24 | - | කොවිඩ්-19 (COVID-19) ව්‍යසනය මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ලබා දිය යුතු සහන ක්‍රියාමාර්ග දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

2020 මාර්තු 27

- කොවිඩ්-19 ව්‍යසනය මගින් බලපෑමට ලක් වූ ස්වයං රැකියාවල නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින් ඇතුළුව ව්‍යාපාර සඳහා සහාය දැක්වීමට 2020 මාර්තු 25 සිට ක්‍රියාත්මක වන ප්‍රතිමූල්‍ය පහසුකමට සහභාගී වීමට අවශ්‍ය සුදුසුකම් දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ 2020 මාර්තු 24 දින 2020 අංක 04 දරන චක්‍රලේඛයට අතිරේකව වන අතර, ප්‍රති මූල්‍ය පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ මෙමගින් සපයනු ලබයි.
- බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිත බව සහ ස්ථාවරත්වය කෙරෙහි බලපානු ලබන ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අතිරික්තයන් සහ වෙනත් සාධක සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග හඳුන්වාදීමට තීරණය කරන ලදී. මෙම සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග වන්නේ, දේශීය පද්ධතිමය  වශයෙන් වැදගත් බැංකු සහ එසේ නොවන බැංකු සඳහා ඔවුන්ගේ ප්‍රාග්ධනය සංරක්ෂණ පිළිවෙළින් පදනම් අංක 100කින් හා 50කින්  අතිරික්තයන් අඩු කිරීමට අවසර දීම, අක්‍රීය ණය වර්ගීකරණය පිළිබඳ ඇතැම් අවශ්‍යතා ලිහිල් කිරීම, යම් යම් කොන්දේසි සපුරාලන බවට බැංකු සහතික කිරීම මත විදේශ ණය මුදල් රුපියල්වලින් පරිවර්තනය කර ආපසු අයකර ගැනීමට අවසර දීම සහ 2020 අවසානයේදී සපුරා ගත යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතා දැනට සපුරා නොමැති බලපත්‍රලාභී බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ නැංවීම 2022 අවසානය දක්වා කල් දැමීම. බලපත්‍රලාභී බැංකු වෙත නියාමනයේදී හඳුනාගත් සැලකිය යුතු කරුණු නිවැරදි කිරීම සඳහා ලබාදී ඇති කාල සීමාවන් ඒවායේ, වැදගත්කම/බැරෑරුම්කම සලකා බලා අවශ්‍ය නම් නැවත සකස්කර ගැනීම සඳහා අවසරදීම සහ කාලීනව සිදුකල යුතු ව්‍යවස්ථාපිත වාර්තාකරණයන් සහ කාර්තුමය මූල්‍ය වාර්තා ප්‍රකාශනය සඳහා නියමිත කාල සීමාවන් පිළිවෙළින්, සති දෙකකින් සහ මසකින් දීර්ඝ කරනු ලැබේ.

අපේක්ෂිත

- නව බැංකු පනතක් කෙටුම්පත් කිරීම
- බලපත්‍රලාභී බැංකුවල ප්‍රතිසාධන සැලසුම් පිළිබඳ නියාමන අවශ්‍යතා ක්‍රියාවට නැංවීම
- බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණ අවධානමට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති රාමුවක් පිහිටුවීම
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල වෙනස්වීම්වලට සමගාමීව විචක්ෂණශීලී අවශ්‍යතා අනුකූල කිරීමේ අරමුණින් පවතින නියාමන අවශ්‍යතා විමර්ශනය කිරීම සහ ඒවාට සංශෝධන හඳුන්වා දීම
- තිරසාර මූල්‍යකරණය සඳහා බැංකු අංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අදාළ පහසුකම් සැලසීම

**බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන්**

2019 මාර්තු 01

- 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ "නිවස්ට් කැපිටල් ලිමිටඩ්" ආයතනයට නිකුත් කර තිබූ ලියාපදිංචිය අහෝසි කරන ලදී. එම සමාගම වෙනත් බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් අත්පත් කර ගන්නා ලදී.

2019 මාර්තු 06

- බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වලට සුරැකුම් සහිත තැන්පතු හැර අනෙකුත් තැන්පතු භාර ගැනීම සීමා කිරීම සඳහා "තැන්පතු" මත විධානයක් නිකුත් කරන ලදී.

2019 අප්‍රේල් 26

- බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා අය කරනු ලබන අසාධාරණ පොලී අනුපාතිකවලින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අරමුණ පෙරදැරිව ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතික හඳුන්වා දෙමින් විධානයක් නිකුත් කරන ලදී.

2019 අප්‍රේල් 29

- බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හි තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාතිකයක් හඳුන්වා දීම සඳහා විධානයක් නිකුත් කරන ලදී.

2019 මැයි 15

- බලපත්‍රලාභී මුදල් සමාගම්වල කොටස් හිමිකාරීත්වය විවිධාංගීකරණය කිරීමේ අරමුණින් යුතුව "බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා හිමිකම් සීමාවන්" යනුවෙන් අදහස් විමසීමේ පත්‍රිකාවක් නිකුත් කරන ලදී.

2019 මැයි 21

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හෝ සංචාරක කර්මාන්තය සඳහා සේවා සපයනු ලබන වෙනත් ඕනෑම අධිකාරියක හෝ නියෝජිත ආයතනයක ලියාපදිංචි පුද්ගලයන් හා ආයතන සඳහා ණය පියවීම සඳහා සහන කාලයක් ලබා දීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතනවලට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

| | |
|---|---|
| 2019 මැයි 31 | - 2019 මැයි 31 දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලයක් සඳහා නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් ප්‍රාථමික වෙළඳ ආයතනයේ ව්‍යාපාර මෙහෙයුම් හා ක්‍රියාකාරකම් අත්හිටුවන ලදී. |
| | - අංක 2125/58 දරන අති විශේෂ ගැසට් පත්‍රය යටතේ, බලපත්‍රලාභී මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේ දී හිමිකම් පෑම්වල ප්‍රමුඛතාව සම්බන්ධයෙන් නියෝග නිකුත් කරන ලදී. |
| 2019 ජුනි 04 | - 2019 අයවැය යෝජනා අනුව සැහැල්ලු ට්‍රක්රථ සඳහා වටිනාකම මත ණය අනුපාතය වැඩි කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කර තිබූ වටිනාකම මත ණය අනුපාත විධානය සංශෝධනය කරන ලදී. |
| 2019 ජූලි 10 | - ටීකේ එස් ෆිනෑන්ස් ලිමිටඩ් මුදල් සමාගම සහ සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී මුදල් සමාගම වෙත බලපත්‍රය අහෝසි කිරීමේ දැන්වීමක් නිකුත් කරන ලදී. |
| 2019 සැප්තැම්බර් 19 | - සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී මුදල් සමාගම යෝජනා කළ ප්‍රාග්ධන වර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා මුදල් මණ්ඩලය විසින් අවස්ථාවක් සලසා දෙන ලදී. |
| | - 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් මුදල් සමාගමට නිකුත් කර තිබූ බලපත්‍රය අහෝසි කරන ලදී. |
| 2019 සැප්තැම්බර් 26 | - මුදල් ණයට දීම සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජිත ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. |
| 2019 ඔක්තෝබර් 16 | - බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ පාර්ශ්වකරුවන් ලද නිරීක්ෂණ හා අදහස් මත පදනම්ව "මුදල් සමාගම්හි කොටස් හිමිකාරීත්ව සීමා" පිළිබඳ දෙවන උපදේශන පත්‍රිකාව නිකුත් කරන ලදී. |
| | - බැංකු නොවන මූල්‍ය අංශයේ ජාත්‍යන්තර හා දේශීය වර්ධනයන්, ජාත්‍යන්තර ප්‍රශස්ථ භාවිතාවන් හා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ සමගාමීව කටයුතු කිරීම සහ අනෙකුත් සම්මත සැකසුම් ආයතන සමඟ අනුගත වීම යන අරමුණ ඇතිව "මුදල් සමාගම්හි ණය අවදානම් කළමනාකරණය" පිළිබඳ උපදේශන පත්‍රිකාව නිකුත් කරන ලදී. |
| 2019 ඔක්තෝබර් 18 | - බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්හි තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාතික හඳුන්වාදෙමින් නිකුත් කළ විධානයෙහි පොලී අනුපාතික සුළු වශයෙන් වැඩි කරමින් සංශෝධනය කරන ලදී. |
| 2019 ඔක්තෝබර් 23 | - ද ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී ආයතනය වෙත බලපත්‍රය අහෝසි කිරීමේ දැන්වීමක් නිකුත් කරන ලදී. |
| 2019 නොවැම්බර් 30 | - නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් ප්‍රාථමික වෙළඳ ආයතනයේ ව්‍යාපාර මෙහෙයුම් හා ක්‍රියාකාරකම් අත්හිටුවීමේ නියෝගය අවලංගු කරන ලදී. |
| 2019 දෙසැම්බර් 19 | - බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නිකුත් කර තිබූ නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය; තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා නිර්ණායක සහ තක්සේරු කිරීමේ වාර ගණන වෙනස්කර සංශෝධනය කරන ලදී. |
| 2019 දෙසැම්බර් 20 | - අලෙවිකාර සෘජු සහභාගීකරුවන්ගේ නිර්ලේඛන භාණ්ඩාගාර බැඳුම්කර සහ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු පිළිබඳ වූ විධානය නිකුත් කරන ලදී. |
| 2020 පෙබරවාරි 14 | - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 මූල්‍ය උපකරණ සහ මහ බැංකුවේ විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුගත වෙමින් ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම් පිළිබඳ අවම අවශ්‍යතා සහිතව නියෝගයක් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 පෙබරවාරි 17 | - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 මූල්‍ය උපකරණ සහ මහ බැංකුවේ විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුගත වෙමින් ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම් පිළිබඳ අවම අවශ්‍යතා සහිතව නියෝගයක් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 10 | - බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මගින් සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණයගැතියන් සඳහා ණය ආධාර සැපයීමට විශේෂ ණය ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 24 | - කොවිඩ්-19 ව්‍යසනයෙන් බලපෑමට පත් ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහන සැලසීම සඳහා චක්‍රලේඛයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2020 මාර්තු 27 | - | 2020 මාර්තු 24 දින නිකුත් කරන ලද චක්‍රලේඛයට අතිරේකව සහ කොවිඩ්-19 ව්‍යසනයෙන් බලපෑමට පත් ස්වයං සේවා නියුක්තිකයන් ඇතුළු ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ආධාර කිරීමට රුපියල් බිලියන 50ක සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් ස්ථාපිත කිරීම සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සහිත චක්‍රලේඛයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 31 | - | වර්තමානයේ වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් මුදල් සමාගම් විසින් පවත්වාගෙන යනු ලබන ද්‍රවශීල වත්කම් සඳහා පවතින විධානය සංශෝධනය කර නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි නව විධානයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සංශෝධනය කිරීම |
| | - | සාංගමික යහපාලන විධානය සංශෝධනය කිරීම |
| | - | විද්‍යුත් මුදල් පද්ධතිය හා ජංගම ගෙවීම් පද්ධතිය ඇතුළුව මූල්‍ය තාක්ෂණික පද්ධතිය (FinTech) සඳහා විධානයන් හඳුන්වා දීම |
| | - | බලපත්‍රලාභී මුදල් සමාගම්වල හිමිකම් සීමාවන් සඳහා විධාන නිකුත් කිරීම සහ අර්බුදයන්ට ලක්ව ඇති මුදල් සමාගම්වල ආයෝජනය කර නැවත ප්‍රතිව්‍යුහගත කිරීම් සිදු කරන ආයෝජකයන් සඳහා සහන සැලසීම |
| | - | මැදි කාලයේදී මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමට සහ ප්‍රත්‍යස්ථ හා හොඳින් ක්‍රියාත්මක වන මුදල් සමාගම් 25 ක් ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාමාර්ග සැලැස්මක් වැඩිදියුණු කිරීම |
| | - | ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත කෙටුම්පත් කර අවසන් කිරීම සහ එයට සමගාමීව නියාමන රාමුවක් සැකසීම |
| | - | අර්බුදයන්ට ලක් වූ සහ ඉහළ අවදානමක් සහිත ආයතන සඳහා ප්‍රමිතිගත නිරාකරණ සැලසුමක් සහ බලපත්‍ර අවලංගු කිරීමේ හා මුදල් සමාගම් ගණන් බේරා වසා දැමීමේ පියවර ඇතුළත් ප්‍රතිපත්ති රාමුවක් සැකසීම |
| | - | අධීක්ෂණ කටයුතු සිදු කරන අනෙකුත් දෙපාර්තමේන්තුවල උපදේශන සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව අධීක්ෂණය කරන සියලුම ආයතන සඳහා ඒකීය මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුවක් ස්ථාපිත කිරීම සහ ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම |
| **රක්ෂණය** | | |
| 2019 පෙබරවාරි 24 | - | ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ, ජීවිත රක්ෂණ අරමුදලේ ලාභ ලෙස නොසලකා හරින ලෙස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගුකාලීන රක්ෂණකරුවන්ට විධාන නිකුත් කරන ලදී. |
| 2019 පෙබරවාරි 25 | - | තනි සෞඛ්‍ය රක්ෂණ ඔප්පු නිකුත් කිරීමට අදාළව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගුකාලීන රක්ෂණකරුවන්ට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2019 පෙබරවාරි 26 | - | ඇතැම් ජීවිත රක්ෂිතයාට/ප්‍රතිලාභියාට ප්‍රතිපත්ති ලේඛනයේ පිටපතක් ලබා දී නොමැති විට එනම්, ජීවිත රක්ෂිතයා රක්ෂණ ඔප්පු හිමිකරුවකු නොවන අවස්ථාවල දී ජීවිත රක්ෂිතයා/ප්‍රතිලාභියාට ප්‍රතිපත්තිමය ලියකියවිලි සැපයීම සම්බන්ධව වන විධානය සංශෝධනය කරන ලදී. |
| 2019 ජූලි 24 | - | රක්ෂණ තැරැව්කරුවන්හට අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් විධාන නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනත සඳහා අදාළ සංශෝධන |
| **ප්‍රාග්ධන වෙළඳපොළ** | | |
| 2019 ජනවාරි 01 | - | කොටස් තැරැව්කාර කර්මාන්තයේ ආයෝජන උපදේශකයන් සඳහා අවම නිපුණතා මට්ටමක් සහතික කිරීමට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් එම කර්මාන්තයට සංශෝධිත සුදුසුකම් රාමුවක් හඳුන්වා දෙන ලදී. |
| 2019 ජනවාරි | - | ගෙවීමට එරෙහිව පැවරුම් යාන්ත්‍රණ ක්‍රියාවලියේ සහ ආන්තිකයන් ගණනය කිරීමේ ක්‍රමෝපායන් වැඩි දියුණු කිරීම සඳහා මෙහෙයුම් හා ව්‍යාපාර කටයුතුවල පිලිවිතර අවසන් කරන ලද අතර එය ක්‍රියාත්ම කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලෙස කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට උපදෙස් ලබා දෙන ලදී. |

| | | |
|---|---|---|
| 2019 ජනවාරි 25 | - | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරියා සහ සභාපතිගේ ද්විප්‍රකාරත්වය (Duality) ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික පාලන රාමුව සංශෝධනය කරන ලදී. |
| 2019 ජුනි 21 | - | රජයට අයත් බැංකු සඳහා අවිනිශ්චිත (Contingent convertibles ) ලැයිස්තුගත කිරීම සඳහා බාසල් III අනුමත රාමුව සකස් කිරීම අවසන් කරන ලදී. |
| අපේක්ෂිත | - | කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ආයතනවල මූලික ලැයිස්තුගත කිරීම පාලනය කරන නියාමන රාමුව සම්බන්ධ යෝජිත සංශෝධනවලට අදාළව ප්‍රතිපත්තියක් සකස් කිරීම |
| | - | කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව අසාමූහිකරණය සඳහා පියවර ගැනීම |
| | - | සුරැකුම්පත් හා විනිමය පනත සංශෝධනය කිරීම |
| | - | වෙළඳපොළ අතරමැදියන් සඳහා මධ්‍යගත යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපත්තිය සම්පාදනය අවසන් කිරීම |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය**

| | | |
|---|---|---|
| 2019 ජූලි 01 | - | "ව්‍යවසායී ශ්‍රී ලංකාවක්" වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන රන් අස්වැන්න, ගොවි නවෝදා, ජය ඉසුර, දිරි සවිය, කාරක ප්‍රාග්ධනය සහ හරිත ණය යෝජනා ක්‍රම මගින් ලබාදෙන ලද ණය සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ණය ඇප ආවරණ ලබා දීම අරමුණු කරගනිමින් නව ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා වන පරිපාලන ගිවිසුම සහභාගීත්ව මූල්‍ය ආයතන සමඟ අත්සන් කරන ලදී. |
| 2019 ජූලි 05 | - | පාස්කු ඉරු දින ප්‍රහාරය හේතුවෙන් බලපෑමට ලක් වූ සංචාරක කර්මාන්තයට ණය සඳහා ලබා දුන් තාවකාලික අත්හිටුවීමට අදාළව සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගත් ප්‍රතිලාභීන්ට සහන ලබා දෙන ලෙස බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් දෙන ලදී. |
| 2019 ජූලි 30 | - | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ණය සංරචක ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන පරිපාලන ගිවිසුම හා සබැඳි දෙවන පරිශිෂ්ටය ශ්‍රී ලංකා රජය සමග අත්සන් කරන ලදී. |
| 2019 අගෝස්තු 05 | - | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි දැනට පවත්නා ණය යෝජනා ක්‍රමවල ලක්ෂණ සංශෝධනය කරමින් සහ නැවත නම් කරමින් නව ණය යෝජනා ක්‍රම 5ක් ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2019 නොවැම්බර් 13 | - | වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සහයෝගය ඇතිව තේ නැවත වගා කිරීමෙහි සහ රබර් නව රෝපණ කටයුතුවල නියැළී සිටින කුඩා වතු හිමියන්ට සහාය දැක්වීමේ අරමුණින් කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන පොලී සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2020 ජනවාරි | - | වෙන් කරන ලද මුළු ප්‍රමාණය රුපියල් මිලියන 390 සිට රුපියල් මිලියන 950 දක්වාත් උපරිම ණය මුදල රුපියල් 500,000 සිට රුපියල් 1,000,000 දක්වාත් ඉහළ නැංවීම සඳහා ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - II හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| | - | ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක ණය සහන යෝජනා ක්‍රමය යටතේ දැනට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා නව ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. |

**ගෙවීම් හා පියවීම්**

| | | |
|---|---|---|
| 2019 පෙබරවාරි 26 | - | විද්‍යුත් ගෙවීම් උපකරණ/යාන්ත්‍රණ මගින් සිදු කෙරෙන ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම් දීම් ලබා දෙන ලෙස මූල්‍ය ආයතනවලට උපදෙස් ලබා දෙමින් 2019 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2019 මාර්තු 11 | - | උපයනු ලබන ශාස්තු ආදායම බෙදා හැරීම විධිමත් කිරීමට, දේශීය මුදල් ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම සඳහා වන 2018 අංක 06 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය ප්‍රතිස්ථාපනය කරමින් දේශීය මුදල් ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම සඳහා වන 2019 අංක 02 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2019 නොවැම්බර් 25 | - | ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් හට, ගනුදෙනුකරුවන්ගේ විද්‍යුත් මුදල් ගිණුම් සඳහා අදාළ වන විද්‍යුත් මුදල් ගිණුම් ගණන, ඒක පුද්ගල රාශිගත අගය සීමාවන්, දින සීමාවන් සහ ගනුදෙනු සීමාවන් විශ්ලේෂණය කිරීමට 2019 අංක 08 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම**

| | | |
|---|---|---|
| 2019 මැයි 13 | - | දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ නියැළී සිටින ආයතන වෙත අවදානම මත පදනම් වූ පිවිසුමට අනුකූලව නිරන්තරයෙන් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සඳහා 2019 අංක 1 දරන රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීති, අංක 2123/14 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලදී. |
| 2019 මැයි 23 | - | 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීති යටතේ, රාජ්‍ය නොවන සංවිධාන, ලාභ නොලබන සංවිධාන හෝ පුණ්‍ය ආයතන සම්බන්ධයෙන් ප්‍රවර්ධිත නිසි උද්යෝගය අනුගමනය කිරීම පිළිබඳ පියවර, 2019 අංක 1 දරන චක්‍රලේඛය මගින් නිකුත් කරන ලදී. |
| | - | ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කළ අංක 2124/32 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින්, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල 4(7) වන නියෝගය යටතේ නම් කරන ලද තැනැත්තන්ගේ ලැයිස්තුව සංශෝධනය කරන ලදී. |
| 2019 අගෝස්තු 22 | - | සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම සඳහා වන 2019 අංක 1 දරන මාර්ගෝපදේශය, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා නිකුත් කරන ලදී. |
| 2019 සැප්තැම්බර් 02 | - | ප්‍රතිලාභ හිමිකාරීත්වය හඳුනා ගැනීම සම්බන්ධයෙන්, 2019 අංක 2 දරන මාර්ගෝපදේශය නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා නිකුත් කරන ලදී. |
| 2019 සැප්තැම්බර් 09 | - | ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කළ අංක 2140/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින්, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවල 4(7) වන නියෝගය යටතේ නම් කරන ලද තැනැත්තන්ගේ ලැයිස්තුව සංශෝධනය කරන ලදී. |
| 2019 ඔක්තෝබර් 01 | - | දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් හඳුනා ගැනීම සඳහා වන 2019 අංක 3 දරන මාර්ගෝපදේශය, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර වෙත නිකුත් කරන ලදී. |
| 2019 දෙසැම්බර් 03 | - | අත්හිටුවනු ලැබූ ගිණුම්වලින් රඳවා ගැනීමේ බදු අයකරගැනීම පිළිබඳ 2019 අංක 2 දරන චක්‍රලේඛය බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 පෙබරවාරි 05 | - | අවස්ථා පාදක කරගත් Lanka FIN වාර්තාකරණය පිළිබඳ 2020 අංක 1 දරන මාර්ගෝපදේශය බලපත්‍රලාභී මුදල් සමාගම්, රක්ෂණ සමාගම් සහ කොටස් තැරැව්කාර සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 31 | - | අදාළ සීමාවට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා කිරීම සඳහා වන කාල සීමාව දීර්ඝ කිරීමේ අති විශේෂ ක්‍රියාමාර්ග පිළිබඳ 2020 අංක 01 දරන චක්‍රලේඛය, වාර්තාකරණ ආයතන වෙත නිකුත් කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2019 පෙබරවාරි 27 | - | 2019 වසරේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සඳහා සහ එවැනි නිකුතුන් සම්බන්ධයෙන් අනේවාසික ආයෝජකයින් හට අදාළ යම් ගෙවීමක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට අවසර ලබා දෙමින් අංක 2112/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. |
| 2019 පෙබරවාරි 28 | - | අදාළ රේඛීය අමාත්‍යාංශයෙහි සහ අදාළ වෙනත් ඕනෑම අධිකාරයක අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා රජය සතුව සියයට 50කට අධික කොටස් ප්‍රාග්ධනයක් සහිත රජය සතු ව්‍යවසායයන් ණය ලබා දෙන්නාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා යොමු කිරීමකින් තොරව, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින්, ශ්‍රී ලංකාවට පරිබාහිරින් ණය ලබා ගැනීමට අවසර ලබා දෙමින් අංක 2112/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. |
| 2019 මාර්තු 26 | - | ඇතැම් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා පෙර ගෙවීම් ක්‍රමය යටතේ, ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් විදේශ විනිමය නිකුත් කිරීම සඳහා පනවා තිබූ සීමා ඉවත් කරමින් බලයලත් වෙළෙඳුන් වෙත විධාන නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2019 ඔක්තෝබර් 17 | - | භාණ්ඩ අපනයනකරුවන් විසින් භාණ්ඩ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත එවිය යුතු කාල සීමාව, අපනයනය කළ දිනයේ පටන් දින 120 සිට දින 180 දක්වා දීර්ඝ කරමින් අංක 2145/49 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 19 | - | සංචාරක, ව්‍යාපාරික, පුහුණු, විදෙස් වෛද්‍ය ප්‍රතිකාර ආදී ඕනෑම අරමුණක් සඳහා විදේශ ගත වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් එ.ජ. ඩොලර් 5,000ක (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන ප්‍රමාණය) උපරිමයකට යටත්ව (පෙර අවසර ලබා දී තිබූ එ.ජ. ඩොලර් 10,000ක විදේශ විනිමය සංචාරක දීමනාව හා සැසඳීමේදී) නිකුත් කිරීමට බලයලත් වෙළෙඳුන් හට දන්වමින් විධානයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 20 | - | බැංකු පනතේ ආනයන සහ විදේශ ව්‍යවහාර මුදල් ආයෝජන සීමා කිරීමට නිකුත් කරන ලද විධානයන්ට සමගාමීව අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ, ගෙවීම මත ලේඛන (Documents Against Payments) සහ විවෘත ගිණුම් (Open Account Payments) ක්‍රම යටතේ ආනයනය කිරීම් සඳහා වන ගෙවීම්වලට විදේශ විනිමය නිකුත් කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි මාස තුනක කාලයක් සඳහා අත්හිටුවිය යුතු බව බලයලත් වෙළඳුන් හට දන්වමින් විධානයක් නිකුත් කරන ලදී. |

**මිල සංශෝධන**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

ලීටරයට රුපියල්

| දිනය | පෙට්‍රල් | | සුදු ඩීසල් | සුපිරි ඩීසල් |
|---|---|---|---|---|
| | 92 ඔක්ටේන් | 95 ඔක්ටේන් | | |
| 2019.01.11 | 123 | 147 | 99 | 118 |
| 2019.02.12 | 129 | 152 | 103 | 126 |
| 2019.03.13 | 132 | 159 | 104 | 134 |
| 2019.04.11 | 132 | 159 | 104 | 134 |
| 2019.05.11 | 135 | 164 | 104 | 136 |
| 2019.06.11 | 138 | 164 | 104 | 136 |
| 2019.07.11 | 136 | 159 | 104 | 131 |
| 2019.08.14 | 138 | 163 | 104 | 134 |
| 2019.09.11 | 137 | 161 | 104 | 132 |
| 2019.10.11 | 137 | 161 | 104 | 132 |

අයිතම කිහිපයක උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2019.05.31 | සුදු සම්බා (වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද) දේශීය (කීරි සම්බා හා සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑමයකට රුපියල් 85ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු නාඩු (වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද) දේශීය (මොට්ටයිකරුපන් හා ආට්ටකාරී හැර) | කිලෝ ග්‍රෑමයකට උපරිම සිල්ලර මිල රුපියල් 74 සිට රුපියල් 80 දක්වා ඉහළ නංවන ලදී. |
| 2019.10.23 | පොල් | පොල් ගෙඩියක් සඳහා වූ රුපියල් 75ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| 2019.12.19 | සුදු/රතු සම්බා (වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද) (කීරි සම්බා හා සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 85 සිට රුපියල් 98 දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු නාඩු (වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද) (මොට්ටයිකරුපන් හා ආට්ටකාරී හැර) | කිලෝ ග්‍රෑමයට උපරිම සිල්ලර මිල රුපියල් 80 සිට රුපියල් 98 දක්වා ඉහළ නංවන ලදී. |
| | රතු නාඩු (වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද) (මොට්ටයිකරුපන් හා ආට්ටකාරී හැර) | කිලෝ ග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල 74 සිට රුපියල් 98 දක්වා ඉහළ නංවන ලදී. |
| 2019.12.27 | ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සිමෙන්ති | කිලෝ ග්‍රෑම් 50කට රුපියල් 1,005ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සිමෙන්ති කුඩු ලෙස ආනයනය කොට ශ්‍රී ලංකාවේදී ඇසුරුම් කළ සිමෙන්ති | කිලෝ ග්‍රෑම් 50කට රුපියල් 950ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | ඇසුරුම්ගතව ආනයනය කරන සිමෙන්ති | කිලෝ ග්‍රෑම් 50කට රුපියල් 930ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.01.29 | ඉවත දැමිය හැකි මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 15ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | ඉවත දැමිය හැකි ශල්‍ය මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 15ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | මුහුණු ආවරණ (එන් 95 වර්ගය - අංශු ශ්වසන පෙරණය) | ඒකකයකට රුපියල් 150ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.02.23 | බොම්බයි ළූණු | කිලෝ ග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 78 සිට රුපියල් 190 දක්වා ඉහළ නංවන ලදී. |
| 2020.03.12 | බ්‍රොයිලර් කුකුල් මස් (සම්පූර්ණ කුකුලකු) - සම සහිත | කිලෝග්‍රෑමයට රුපියල් 430ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | බ්‍රොයිලර් කුකුල් මස් (සම්පූර්ණ කුකුලකු) - සම රහිත | කිලෝග්‍රෑමයට රුපියල් 500ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | බඩ ඉරිඟු (ඕනෑම කාර්යයක් සඳහා භාවිතා කරන) | කිලෝග්‍රෑමයට රුපියල් 55ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |

| | | |
|---|---|---|
| 2020.03.16 | පහත සඳහන් වෛද්‍ය උපකරණ සඳහා 2020 ජනවාරි 29 වන දින පනවන ලද උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී. | |
| | ඉවත දැමිය හැකි මුහුණු ආවරණ - ස්ථර තුනක් සහිත - නොවියන ලද (ලූපය හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 50ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | මුහුණු ආවරණ - එන් 95 වර්ගය (ශල්‍ය/සෞඛ්‍ය රක්ෂිත/ශ්වසන/ වෛද්‍ය) | ඒකකයකට රුපියල් 325ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.03.18 | මයිසූර් පරිප්පු | කිලෝග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 130 සිට රුපියල් 65 දක්වා පහළ දමන ලදී. |
| | බොම්බයි ළූණු | කිලෝග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 190 සිට රුපියල් 150 දක්වා පහළ දමන ලදී. |
| | ටින් මාළු | ශුද්ධ බර ග්‍රෑම් 425ක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 140 සිට රුපියල් 100 දක්වා පහළ දමන ලදී. |

2019 ඔක්තෝබර් 04 - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,493 දක්වා රුපියල් 240කින් අඩු කරන ලදී.

**බදු සංශෝධන**

**පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු**

2020 ජනවාරි 01 - පුද්ගල ආදායම් බදු අනුපාතික සියයට 4, සියයට 8, සියයට 12, සියයට 16, සියයට 20 සහ සියයට 24 සිට සියයට 6, සියයට 12 සහ සියයට 18 දක්වා සංශෝධනය කරන ලදී. බදු නිදහස් සීමාව, සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා වූ වාර්ෂිකව රුපියල් මිලියන 1.2 සහ පුද්ගල ආදායම සඳහා වූ වාර්ෂිකව රුපියල් 500,000 යන සීමාවල සිට ඕනෑම ආදායමක් සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 3 දක්වා ඉහළ නංවන ලදී. තවද, ආදායම් බදු කාණ්ඩ වාර්ෂිකව රුපියල් 600,000 සිට වාර්ෂිකව රුපියල් මිලියන 3 දක්වා ඉහළ නංවන ලදී.

- 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සංස්ථාපිත ආදායම් බදු අනුපාතික පහත පරිදි සංශෝධනය කරන ලදී.
  - සම්මත සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28 සිට සියයට 24 දක්වා අඩු කරන ලදී.
  - ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අදාළ වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28 සිට සියයට 14 දක්වා අඩු කරන ලදී
  - නිෂ්පාදන කර්මාන්තය සඳහා වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 18ක් ලෙස සංශෝධනය කරන ලදී.

**උපයන විට ගෙවීමේ බද්ද**

2020 ජනවාරි 01 - ඕනෑම නේවාසික හෝ අනේවාසික පුද්ගලයකුගේ සේවා නියුක්ති ආදායම් ලැබීම් මත අයකරන ලද උපයන විට ගෙවීමේ බද්ද ඉවත් කරන ලදී. ඒ අනුව, එම සේවා නියුක්ති ආදායම් ලැබීම් සියයට 6, සියයට 12 සහ සියයට 18 යන අනුපාතිකයන්ට අනුව පුද්ගල ආදායම් බද්දට යටත් වේ.

**රඳවා ගැනීමේ බදු**

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 01 | - | පහත සඳහන් අවස්ථා හැර ඕනෑම නේවාසික පුද්ගලයකුට කරන ලද ඕනෑම ගෙවීමක් මත අය කරනු ලැබූ රඳවා ගැනීමේ බදු ඉවත් කරන ලදී.<br>- ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම හෝ සූදු ජයග්‍රහණ සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණ මත වූ සියයට 14ක රඳවා ගැනීමේ බද්ද<br>- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් පවත්වන ලද වෙන්දේසියක දී ඕනෑම මැණික් වර්ගයක් විකිණීම මත වූ සියයට 2.5ක රඳවා ගැනීමේ බද්ද<br>- ඕනෑම අනේවාසිකයකුට සිදු කරන ගෙවීම් මත වූ රඳවා ගැනීමේ බද්ද |

**ආර්ථික සේවා ගාස්තුව**

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 01 | - | 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තුව ඉවත් කරන ලදී. |

**ආදායම් බදු නිදහස් කිරීම්**

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 01 | - | තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා උපයන ලාභ සහ ආදායම |
| | - | සේවාවන් සඳහා වන ගෙවීම් බැංකුවක් හරහා විදේශ මුදල්වලින් ලැබෙන්නේ නම්, විදේශ ප්‍රභවයන්ගෙන් උපයන ආදායම ද ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයින්ට සපයනු ලබන සේවාවන්ගෙන් ලැබෙන ලාභය සහ ආදායම |
| | - | අනේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම් හෝ නේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම්වලින් උපයන පොලී ආදායම |
| | - | නේවාසික සමාගමක් විසින් ඕනෑම අනේවාසිකයකුට ගෙවන ලාභාංශ |
| | - | වාණිජ කේන්ද්‍රීය ව්‍යවසායයන් විසින් බෙදා හරිනු ලබන ලාභාංශ |
| | - | රසායනාගාර සේවා හෝ ප්‍රමිති සහතික කිරීමේ සේවාවන්ගෙන් ඕනෑම අනේවාසිකයකු විසින් ලබා ගත් මුදල් |
| | - | ප්‍රදාන සහ පරිත්‍යාග ලෙස ඕනෑම ආගමික ආයතනයකට ලැබෙන මුදල් |

**එකතු කළ අගය මත බදු**

| | | |
|---|---|---|
| 2019 මැයි 21 | - | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, සංචාරක නිකේතන, ආපනශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ආයතනවල සේවා සැපයුම සහ සංචාරක නියෝජිතයින් විසින් සිදු කරන රට තුළට එන සංචාර හා සම්බන්ධ සේවා සැපයුම මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය වසරක කාලයක් සඳහා සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. |
| 2019 ජූනි 01 | - | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, සංචාරක නිකේතන, ආපනශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ආයතනවල සේවා සැපයුම සහ සංචාරක නියෝජිතයින් විසින් සිදු කරන රට තුළට එන සංචාර හා සම්බන්ධ සේවා සැපයුම මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය 2020 මාර්තු 31 දක්වා වන කාලය සඳහා සියයට 5 සිට සියයට 7 දක්වා වැඩි කරන ලදී. |
| 2019 නොවැම්බර් 01 | - | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත, අපනයනය පදනම් කර ගත් සමාගම් විසින් ඇතැම් ඇඟලුම් දේශීයව විකිණීමේදී, ඒකක මත පදනම් කරගත් එකතු කළ අගය මත බදු අනුපාතිකය රුපියල් 75 සිට රුපියල් 100 දක්වා ඉහළ නංවන ලදී. |
| | - | දේශීයව නිෂ්පාදනය කරන ලද සහල්වලින් සැකසූ සහල් නිවුඩු තෙල් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් විදේශයන්හි සිදු කරනු ලබන ඔවුන්ගේ ව්‍යාපෘතිවලට භාණ්ඩ සැපයීම මත එකතු කළ අගය මත බදු ගණනය කිරීමේදී එම සැපයීම අපනයන ලෙස සලකනු ලැබේ. |

- පදිංචිය සඳහා සහාධිපත්‍ය නිවාස ඒකක සැපයීම මත අදාළ වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 6 දක්වා අඩු කළ අතර, එකී සැපයුම් සඳහා අදාළ යෙදවුම් බද්ද සියයට 5කි.
- 2016 නොවැම්බර් 01 දින හෝ ඊට පසු හා 2019 අප්‍රේල් 01 දිනට පෙර ඕනෑම පුද්ගලයකු විසින් සිදු කරනු ලැබූ පදිංචිය සඳහා නිවාස සැපයීම, බදු දීම හෝ කුලියට දීම යන සේවාවන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- 2019 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව, පහත සඳහන් අවස්ථාවලදී පදිංචිය සඳහා නිවාස සැපයීම, බදු දීම හෝ කුලියට දීම යන සේවාවන් සිදු කර ඇත්නම්, 2019 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි, එකී සැපයුම් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
  - කිසිදු සහාධිපත්‍ය නිවාස ඒකකයක් විකිණීම හා සම්බන්ධ නොවේ.
  - සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘතියක සහාධිපත්‍ය නිවාස ඒකකයක් සැපයීමේදී සහ එම ව්‍යාපෘතියේ ඕනෑම තනි ඒකකයක උපරිම මිල හෝ වෙළඳපොළ වටිනාකම රුපියල් මිලියන 25 නොඉක්මවන විට.
  - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත බලාත්මක කළ දිනට පෙර දිනකදී නොතාරිස් ආඥා පනත අනුව සහාධිපත්‍ය නිවාස දේපල ඒකක විකිණීම පිළිබඳ ගිවිසුමක් හා සම්බන්ධ වේ.
  - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත බලාත්මක කළ දිනට පෙර දිනකදී සම්පූර්ණ කරන ලද හා අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුකූලතා සහතිකයක් ලබා ගෙන ඇති සහාධිපත්‍ය නිවාස ඒකකයන් සැපයීම.

2019 දෙසැම්බර් 01

- එකතු කළ අගය මත බදු අනුපාතිකය පහත පරිදි සංශෝධනය කරන ලදී.
  - මුළු යෙදවුම් වටිනාකමින් සියයට හැටකට නොඅඩු ප්‍රමාණයක් දේශීය සැපයුම්/මූලාශ්‍රවලින් ප්‍රභවය වන්නේ නම්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, සංචාරක නිකේතන, ආපනශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ඒ හා සමාන ආයතන විසින් සපයන සේවා, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම
  - මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15ක මට්ටමක පවත්වා ගැනීම
  - භාණ්ඩ (රෙදි) ආනයනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම.
  - ඕනෑම පුද්ගලයෙකු විසින් පදිංචිය සඳහා සහාධිපත්‍ය නිවාස ඒකක විකිණීම මත වන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම
  - ඉහත සඳහන් කළ භාණ්ඩ හා සේවා ආනයනය සහ/හෝ සැපයීම හැර සේවා සැපයීම හෝ භාණ්ඩ ආනයනය මත එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කිරීම[2]

2020 ජනවාරි 01

- එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රුපියල් මිලියන 12 සිට වාර්ෂිකව රුපියල් මිලියන 300 දක්වා ඉහළ නංවන ලදී.
- තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

2020 මාර්තු 23

- 2020 පෙබරවාරි සහ මාර්තු මාසවලට අදාළව 2020 මාර්තු 20 දිනට සහ 2020 අප්‍රේල් 20 දිනට නියමිතව තිබූ එකතු කළ අගය මත බදු ගෙවීම් සඳහා 2020 අප්‍රේල් 30 දක්වා අවසර ලබා දෙන ලදී.

**ජාතිය ගොඩනැගීමේ බදු**

2019 නොවැම්බර් 01

- දුම්වැටි ආනයනය, සහ ආනයනය කරන ලද හෝ දේශීයව නිපදවන ලද දුම්වැටි අලෙවි කිරීම මත වන ජාතිය ගොඩනැගීමේ බදු නිදහස ඉවත් කරන ලදී.
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ලියාපදිංචි වී ඇති ආනයනකරුවෙකු විසින් කපා ඔප දැමීමෙන් පසු ප්‍රති අපනයන කිරීම සඳහා ආනයනය කරනු ලබන මැණික් ගල්, එම සේවාවන් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කර ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇත්නම්, ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

2 පාර්ලිමේන්තුව විසින් අනුමැතිය ලබාදී ඇත.

| | |
|---|---|
| | - ආනයනික පිරිපහදු නොකළ පාම් තෙල් හෝ ආනයනික පාම් තෙල් වලින් පාම් තෙල් නිපදවන දේශිය පාම් තෙල් නිෂ්පාදකයින්ගේ පිරිවැටුම, ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - ලුසර්න් (ඇල්ෆල්ෆා) ආහාර හා තැටි ආනයනය ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - විනෝදාස්වාදය හෝ ක්‍රීඩා සඳහා වන යාත්‍රා හා නැව්, පදින බෝට්ටු සහ ඔරු (canvas) ආනයනය ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - එ.ජ. ඩොලර් මිලියන 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යම් කිසි ව්‍යාපෘතියක ආයෝජනය කරනු ලබන, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී ඇති ව්‍යවසායයක් විසින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ හෝ වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර ආනයනය කරනු ලබන භාණ්ඩ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - කිසියම් ගොඩනැගිල්ලක්, මාර්ගයක්, පාලමක්, ජල සැපයුමක්, ජලපවාහන හෝ මලපවහන පද්ධතියක්, වරායක්, ගුවන් තොටුපොළක් හෝ විදුලි සංදේශ හෝ විදුලිය සඳහා වන යටිතල පහසුකම් ව්‍යාපෘතියක් ඉදි කිරීම හා සම්බන්ධ ඉදි කිරීම් කොන්ත්‍රාත්කරුවකුගේ හෝ උප කොන්ත්‍රාත්කරුවකුගේ සේවාවන් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති සංචාරක හෝටල්, සංචාරක නිකේතන, ආපනශාලා හෝ වෙනත් සමාන ව්‍යාපාරවල විදේශ මුදල් ලැබීම් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී |
| 2019 දෙසැම්බර් 01 | - 2019 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කරන ලදී. |

**නිෂ්පාදන/සුරා බදු**

මධ්‍යසාර පරිමාව පදනම් කර ගනිමින් දේශීයව නිපදවන මත්පැන් මත වන සුරා බදු පහත පරිදි සංශෝධනය කරන ලදී.

| වර්ගය | පෙර පැවති බද්ද (මධ්‍යසාර ලීටරයට රුපියල්) | බදු සංශෝධනය (මධ්‍යසාර ලීටරයට රුපියල්) | |
|---|---|---|---|
| | **2017.11.10 සිට බලපැවැත්වෙන පරිදි** | **2019.03.06** | **2019.12.03** |
| විශේෂ අරක්කු | 3,300 | 3,300 | 3,800 |
| අනෙකුත් අරක්කු | 3,300 | 3,550 | 4,050 |
| මෙරට නිෂ්පාදිත විදේශ අරක්කු | 3,300 | 3,550 | 4,150 |
| බියර් (මධ්‍යසාර ප්‍රතිශතය සියයට 5 ට අඩු) | 2,400 | 2,700 | 3,200 |
| බියර් (මධ්‍යසාර ප්‍රතිශතය සියයට 5 ට වැඩි) | 2,400 | 2,700 | 3,200 |
| දේශීය වයින් | 100 (අ) | 600 | 900 |

(අ) 2011.11.22 දින සිට බලපැවැත්වෙන පරිදි

ආනයනික මත්පැන් මත වන සුරා බද්ද පහත පරිදි ඉහළ නංවන ලදී.

| වර්ගය | පෙර පැවති බද්ද (තොග ලීටරයට රුපියල්) | බදු සංශෝධනය (තොග ලීටරයට රුපියල්) | |
|---|---|---|---|
| | 2017.07.28 සිට බලපැවැත්වෙන පරිදි | 2019.03.06 | 2019.12.03 |
| මෝල්ට් මත්පැන් (බියර්) | 50 | 55 | 135 |
| වයින් | 100 | 110 | 230 |
| අනෙකුත් මත්පැන් | 200 | 215 | 650 |

**නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද**

දුම්වැටි සඳහා වන නිෂ්පාදන බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| වර්ගය | පෙර පැවති බද්ද (දුම්වැටි 1,000 ට රුපියල්) | බදු සංශෝධන (දුම්වැටි 1,000 ට රුපියල්) | | | | |
|---|---|---|---|---|---|---|
| | 2017.11.10 දින සිට බලපැවැත්වෙන පරිදි | 2019.03.06 | 2019.05.13 | 2019.07.11 | 2019.10.15 | 2019.12.01 |
| මි.මී. 60 ට අඩු | 11,675 | - | - | - | - | 13,360 |
| මි.මී. 60 - 67 | 17,375 | 19,500 | - | - | - | 22,300 |
| මි.මී. 67 - 72 | 20,500 | 23,000 | - | 37,600 | 33,000 | 37,650 |
| මි.මී. 72 - 84 | 33,550 (අ) | 37,580 | 37,600 | - | - | 43,100 |
| මි.මී. 84 ට වැඩි | 37,675 (අ) | 42,200 | - | - | - | 48,350 |

(අ) 2018.08.01 දින සිට බලපැවැත්වේ.

අයිතම කිහිපයක් සඳහා නිෂ්පාදන බදු පහත පරිදි සංශෝධනය කරන ලදී.

| අයිතමය | පැවති බද්ද | 2019.03.06 වන දින බදු සංශෝධන |
|---|---|---|
| පැණි රසකාරක පාන වර්ග | බදු නිදහස් ප්‍රමාණය ඉක්මවන සීනි ග්‍රෑම් 01ක් සඳහා ශත 30ක් හෝ ලීටරයට රුපියල් 12ක් - 2018.12.04 දින සිට බලපැවැත්වෙන පරිදි (අ) | බදු නිදහස් ප්‍රමාණය ඉක්මවන සීනි ග්‍රෑම් 01ක් සඳහා ශත 40ක් හෝ ලීටරයට රුපියල් 12ක් (අ) |
| පාම් තෙල් මේද අම්ල | සියයට 25 - 2018.10.09 දින සිට බලපැවැත්වෙන පරිදි | සියයට 20 |
| ටැලෝ මේද අම්ල | සියයට 25 - 2018.10.09 දින සිට බලපැවැත්වෙන පරිදි | සියයට 20 |

| | | |
|---|---|---|
| ශීතකරණ | සියයට 17 - 2017.11.10 දින සිට බලපැවැත්වෙන පරිදි | සියයට 25 |
| එන්ජිම සවි කළ චැසි ලෙස ආනයනය කරනු ලබන වාහන | රුපියල් 700,000 - 2017.11.10 දින සිට බලපැවැත්වෙන පරිදි | රුපියල් 500,000 |

(අ) බීම වර්ගවල අඩංගු බදු නිදහස් සීනි ප්‍රමාණය පහත පරිදි අඩු කරන ලදී.

- කාබනේට් අඩංගු පාන වර්ග සඳහා මිලි ලීටර 100ට ග්‍රෑම් 6 සිට මිලි ලීටර 100 ට ග්‍රෑම් 4 දක්වා
- පළතුරු අඩංගු පාන වර්ග සඳහා මිල ලීටර 100ට අඩු ග්‍රෑම් 9 සිට මිලි ලීටර 100 ට ග්‍රෑම් 8 දක්වා

2019 මාර්තු 06 - එන්ජින් ධාරිතාවය ඝන සෙන්ටිමීටර 2,000ට අඩු වාහන සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ නංවන ලදී.

- අවමංගල රථ, දෙමුහුන් හා විද්‍යුත් වෑන් රථ සහ කැබ් රථ මත වන නිෂ්පාදන බදු අඩු කරන ලදී.
- කිලෝග්‍රෑම් 2,000ට නොවැඩි භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවයක් සහිත කුඩා ලොරි රථවල නිෂ්පාදන බද්ද අඩු කරන ලදී.

2019 මාර්තු 15 - තෝරාගත් විද්‍යුත් වාහන සඳහා වන නිෂ්පාදන බද්ද අඩු කරන ලදී.

**ආනයන තීරු බදු**

පෙට්‍රල් හා ඩීසල් ආනයනය සඳහා වන ආනයන තීරු බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | වර්ගය | ආනයන තීරු බද්ද (ලීටරයට රුපියල්) | ආනයන තීරු බදු සහනය (ලීටරයට රුපියල්) | අදාළ තීරු බද්ද (ලීටරයට රුපියල්) |
|---|---|---|---|---|
| 2018.12.29 | පෙට්‍රල් (92 ඔක්ටේන්) | 35.00 | 20.00 | 15.00 |
| 2019.01.12 | | 35.00 | 19.00 | 16.00 |
| 2019.06.12 | | 35.00 | 18.00 | 17.00 |
| 2019.09.11 | | 35.00 | 17.00 | 18.00 |
| 2018.11.20 | සුදු ඩීසල් | 5.85 | 5.00 | 0.85 |
| 2019.01.12 | | 5.85 | 3.00 | 2.85 |
| 2019.01.12 | සුපිරි ඩීසල් | 10.55 | - | 10.55 |
| 2019.06.12 | | 15.00 | 1.00 | 14.00 |
| 2019.07.11 | | 15.00 | - | 15.00 |

2019 මාර්තු 06 - පානීය නොවන එතනෝල් මධ්‍යසාර ලීටරයකට අය කරන තීරු බද්ද ලීටරයට රුපියල් 1,000 දක්වා ලීටරයට රුපියල් 200 කින් වැඩි කරන ලදී.

- ගෝ-කාර්ට් සහ ගෝ-කාර්ට් ටයර් ආනයනය මත වන සියයට 30ක තීරු බද්ද ඉවත් කරන ලදී.
- තෝරාගත් ආනයනික භාණ්ඩ 261 ක් සඳහා අදාළ වන ඒකක ආනයන බද්ද සියයට 10කින් වැඩි කරන ලදී.

2019 සැප්තැම්බර් 28 - ආනයනික පළතුරු බීම සඳහා අදාළ වන ආනයන තීරු බද්ද සංශෝධනය කරන ලදී.

2020 ජනවාරි 14 - කිරිගු පිටි සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 13ක බදු සහනයක් ලබාදෙන ලද අතර, ඒ සඳහා අදාළ වන බද්ද කිලෝ ග්‍රෑමයට රුපියල් 3කි.

**සෙස් බද්ද**

2019 මාර්තු 06

- අලුත් හා වියළි පළතුරු, අලුත් හා වියළි ගෙඩි වර්ග සහ භාවිතා කරන ලද හෝ අලුත්වැඩියා කරන ලද ශීතකරණ සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.
- බීඩි කොළ සඳහා වන සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 2,500 සිට කිලෝග්‍රෑමයට රුපියල් 3,500 දක්වා ඉහළ නංවන ලදී.
- මෝටර් වාහන කොටස්, දිරීමට පත්වන සහ කොම්පෝස්ට්කරණය කළ හැකි ප්ලාස්ටික් මත වන සෙස් බද්ද සංශෝධනය කරන ලදී.

2019 ඔක්තෝබර් 03

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්ගත වී ඇති සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ ව්‍යාපාරයක් විසින් ආනයනය කරනු ලබන ගෘහ භාණ්ඩ සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.
- 2019 මාර්තු 06 වන දින හෝ ඊට පසුව එ.ජ. ඩොලර් මිලියන 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යම්කිසි ව්‍යාපෘතියක ආයෝජනය කරනු ලබන ඕනෑම ව්‍යවසායයක් විසින්, එම ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ, නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක් සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.
- දේශගුණික තත්ත්වයන් පාලනය කෙරෙන ගබඩා පහසුකම්/ශීත දාම සැපයුම් යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘතියක ආයෝජනය කරනු ලබන ඕනෑම ව්‍යවසායයක් විසින්, එම ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ, නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියට යටත්ව, අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.

2020 ජනවාරි 14

- තිරිඟු පිටි සඳහා වන කිලෝග්‍රෑමයට රුපියල් 15ක සෙස් බද්ද ඉවත් කරන ලදී.

**විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද**

ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2019.01.04 | උඳු | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 125 සිට කිලෝග්‍රෑමයට රුපියල් 200 දක්වා වැඩි කරන ලදී. |
| 2019.02.02 | කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), බීට් සීනි, උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.02.08 | අර්තාපල් | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| 2019.02.09 | ඉරිඟු | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා වැඩි කරන ලදී. |
| 2019.02.25 | එළවළු තෙල් | වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | | |
|---|---|---|
| 2019.03.03 | බොම්බයි ළූණු | කිලෝ ග්‍රෑමයට රුපියල් 20ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.05.08 | හාල්මැස්සන්, කරවල, අර්තාපල්, මුං ඇට, මැංගුස්ටින් (අලුත් සහ වියළි), දොඩම් (වියළි), පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස් සහ ස්ලොස් සහ කිවි ෆෲට් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.05.21 | රතු ළූණු, මෑ වර්ගයේ ඇට (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), මිදි (වියළි), සුදුරු බීජ, මහදුරු බීජ සහ මාගරින් | වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.05.22 | බොම්බයි ළූණු | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී. |
| 2019.07.04 | උඳු | කිලෝ ග්‍රෑමයට රුපියල් 200ක් වූ බද්ද වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.07.11 | රට ඉඳි (අලුත් සහ වියළි) | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 60 සිට කිලෝග්‍රෑමයට රුපියල් 80 දක්වා වැඩි කරන ලදී. |
| | දොඩම් (අලුත්) | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 65 සිට කිලෝග්‍රෑමයට රුපියල් 80 දක්වා වැඩි කරන ලදී. |
| | ඇපල් (අලුත්) | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 45 සිට කිලෝග්‍රෑමයට රුපියල් 60 දක්වා වැඩි කරන ලදී. |
| | එළවළු තෙල් | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 25කින් වැඩි කරන ලදී. |
| 2019.07.19 | උම්බලකඩ, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි, පෙරන්ගානා ලද හෝ පිටි කරන ලද කේජු සහ ටින් මාළු | වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.08.02 | කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රතු පරිප්පු (සම්පූර්ණ සහ පියළි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), බීට් සහ උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.08.09 | ඉරිඟු | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී. |
| 2019.08.11 | රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), ඇපල් (අලුත්) සහ එළවළු තෙල් | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.09.08 | මැකරල්, කව්පි සහ කුරක්කන් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.09.11 | උඳු | කිලෝග්‍රෑමයට රුපියල් 200ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | | |
|---|---|---|
| 2019.10.01 | මාළු (අලුත් හෝ ශීත කළ), යෝගට්, වෙඬරු, කිරිවලින් නිපද වූ තැවරුම්, සුදු ළූණු, මිදි (අලුත්), උළුහාල් ඇට, කුරක්කන් පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලූණු | වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.10.03 | බොම්බයි ළූණු | දින 31 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල දක්වා අඩු කරන ලදී. |
| 2019.10.29 | මාළු (අළුත් හෝ ශීතකල) | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට සියයට 10 හෝ රුපියල් 100 යන දෙකෙන් වැඩි අගයේ සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා සංශෝධනය කරන ලදී. |
| | මිරිස් (වියළි, කුඩු නොකළ හා නොඇඹරූ) | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී. |
| 2019.11.03 | බොම්බයි ළූණු | කිලෝග්‍රෑමයට රුපියලක් වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.11.08 | හාල් මැස්සන්, කරවල, අර්තාපල්, මුං ඇට, මැංගුස්ටින් (අලුත් සහ වියළි), දොඩම් (වියළි), පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස්, ස්ලෝස් සහ කිවි ෆෲට් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.11.11 | රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), ඇපල් (අලුත්) සහ එළවළු තෙල් | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2019.12.14 | තිරිඟු පිටි | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 8 ක් ලෙස පනවන ලදී. |
| 2019.12.25 | අර්තාපල් | දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා අඩු කරන ලදී. |
| 2020.01.25 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.02.02 | බොම්බයි ළූණු, කොණ්ඩ කඩල, රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි) දොඩම් (අලුත්), ඇපල් (අලුත්). බඩ ඉරිඟු, එළවළු තෙල්, බීට් සහ උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.02.07 | මාළු (අලුත් හේ ශීත කළ) | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25ක් දක්වා අඩු කරන ලදී. |
| 2020.02.25 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | | |
|---|---|---|
| 2020.03.04 | මාළු (අළුත් හෝ ශීතකල) | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 150ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2020.03.08 | මැකරල්, උඳු, කව්පි සහ කුරක්කන් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

**වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද**

2019 මාර්තු 06
- සංචාරක අංශය ප්‍රවර්ධනය කිරීම සහ දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයේ මූලික පිරිවැය අවම කිරීම සඳහා තෝරාගත් භාණ්ඩ කිහිපයක් සඳහා අය කළ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 7.5 සිට සියයට 2.5 දක්වා අඩු කරන ලදී.
- මැණික් කැපීම සහ ඔප දැමීම සඳහා භාවිතා කරන යන්ත්‍ර මත අය කළ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.
- ලූසර්න් (ඇල්ෆල්ෆා) ආහාර සහ තැටි ආනයනය මත අය කළ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.
- විනෝදාස්වාදය සඳහා භාවිතා කරන යාත්‍රා සහ නැව්, පදින බෝට්ටු හා ඔරු සහ රුවල් බෝට්ටු නිෂ්පාදනය කරනු ලබන ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත සමාගම් විසින් සිය ව්‍යාපාරය ලෙස මෙම යාත්‍රා හා නැව් කුලියට දෙනු ලබන ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත සමාගම් වෙත විකිණීමේදී අය කළ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.

2019 මැයි 07
- ආනයනික ආරක්ෂක උපකරණ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

2019 ජූනි 01
- උසස් තාක්ෂණික යන්ත්‍රෝපකරණ වර්ග කිහිපයක් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

2019 සැප්තැම්බර් 25
- 2019 මාර්තු 06 වන දින හෝ ඊට පසුව එ.ජ. ඩොලර් මිලියන 50 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යම් කිසි ව්‍යාපෘතියක ආයෝජනය කරනු ලබන ඕනෑම ව්‍යවසායයක් විසින්, එම ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ, නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.
- දේශගුණික තත්ත්වයන් පාලනය කෙරෙන ගබඩා පහසුකම්/ශීත දාම සැපයුම් යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘතියක ආයෝජනය කරනු ලබන ඕනෑම ව්‍යවසායයක් විසින්, එම ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ, නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියට යටත්ව, අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.
- තෝරාගත් අයිතම 368ක් සඳහා අය කළ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 7.5 සිට සියයට 2.5 දක්වා අඩු කළ අතර, තෝරාගත් අයිතම හයක් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

2019 දෙසැම්බර් 06
- වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 7.5 සිට සියයට 10 දක්වා ඉහළ නංවන ලදී.
- තෝරාගත් භාණ්ඩ ආනයනය සඳහා සහනදායී අනුපාතික සහ බදු නිදහස් කිරීම් ලබා දෙන ලදී.

**මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද**

2019 මාර්තු 06
- එන්ජින් ධාරිතාවය සහ බදු නිදහස් සීමාව ඉක්මවන ප්‍රමාණය මත පදනම්ව, ආනයනික මෝටර් වාහන සඳහා පිරිවැය, රක්ෂණ හා නැව් ගාස්තු අගය (CIF Value) මත පදනම්වද, දේශීයව එකලස් කරන ලද වාහන සඳහා නිෂ්පාදන මිල මත පදනම්වද සුඛෝපභෝගී බද්ද පහත පරිදි පැනවීම සඳහා අංක 2113/11 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

| වාහන වර්ගය | එන්ජින් ධාරිතාවය | සුඛෝපභෝගී බදු නිදහස් සීමාව | අනුපාතය (අ) |
|---|---|---|---|
| ඩීසල් | ඝන සෙ.මී. 2,300 ට වැඩි | රුපියල් මිලියන 3.5 | 120% |
| පෙට්‍රල් | ඝන සෙ.මී. 1,800 ට වැඩි | රුපියල් මිලියන 3.5 | 100% |
| දෙමුහුන් ඩීසල් | ඝන සෙ.මී. 2,300 ට වැඩි | රුපියල් මිලියන 4.0 | 90% |
| දෙමුහුන් පෙට්‍රල් | ඝන සෙ.මී. 1,800 ට වැඩි | රුපියල් මිලියන 4.0 | 80% |
| විද්‍යුත් | කි. වොට් 200 ට වැඩි | රුපියල් මිලියන 6.0 | 60% |

(අ) සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ඉක්මවා යන අගය සහ එන්ජින් ධාරිතාවය මත අය කරනු ලබයි.

2019 නොවැම්බර් 01 - මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද අය කිරීමේ දී එන්ජින් ධාරිතාවය සලකා බැලීම ඉවත් කළ අතර බදු නිදහස් සීමාව ඉක්මවන ප්‍රමාණය මත ආනයනික මෝටර් වාහන සඳහා පිරිවැය, රක්ෂණ හා නැව් ගාස්තු අගය (CIF Value) මත පදනම්ව ද දේශීයව එකලස් කරන ලද වාහන සඳහා නිෂ්පාදන මිල මත පදනම්වද සුඛෝපභෝගී බද්ද අය කෙරෙනු ඇත.

**කාබන් බද්ද**

2019 ජනවාරි 01 - 2018 අංක 35 දරන මුදල් පනත මගින් මෝටර් වාහන සඳහා පහත පරිදි කාබන් බද්දක් පනවන ලදී.

| වාහන වර්ගය | වාහනයේ ආයු කාලය (අවුරුදු)/අනුපාතය | | |
|---|---|---|---|
| | වසර 5 ට අඩු | වසර 5 සිට 10 දක්වා | වසර 10 ට වැඩි |
| දෙමුහුන් (පෙට්‍රල්/ඩීසල්) | ඝන සෙන්ටි මීටරයට ශත 25 | ඝන සෙන්ටි මීටරයට ශත 50 | ඝන සෙන්ටි මීටරයට රුපියල් 1.00 |
| ඉන්ධන (පෙට්‍රල්/ඩීසල්) | ඝන සෙන්ටි මීටරයට ශත 50 | ඝන සෙන්ටි මීටරයට රුපියල් 1.00 | ඝන සෙන්ටි මීටරයට රුපියල් 1.50 |
| මගී බස් රථ | රුපියල් 1,000 | රුපියල් 2,000 | රුපියල් 3,000 |

2019 දෙසැම්බර් 01 - කාබන් බද්ද ඉවත් කරන ලදී.

**අනෙකුත් බදු සහ අය බදු**

2019 ජනවාරි 01 - ජංගම දුරකථන ක්‍රියාකරුවන් සඳහා වාර්ෂිකව රුපියල් 200,000ක ජංගම දුරකථන සන්නිවේදන කුළුණු බද්දක් පනවන ලදී.

- ජංගම කෙටි පණිවුඩ සේවා හරහා යවනු ලබන වෙළඳ දැන්වීම් සඳහා, එක් ජංගම කෙටි පණිවුඩයකට ශත 25 බැගින් වන ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පනවන ලදී.

2019 අප්‍රේල් 01 - ගුවන් යානයකින් හෝ නැව් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම මගියෙක් සඳහාම අය කරන නැව් නැගීමේ/ ගුවන්ගත වීමේ බද්ද එ.ජ. ඩොලර් 60 දක්වා එ.ජ. ඩොලර් 10කින් වැඩි කිරීම.

| | | |
|---|---|---|
| 2019 අගෝස්තු 01 | - | වැඩි කරන ලද නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බද්ද 2019 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරනු ලැබූ අතර, එ.ජ. ඩොලර් 50 ක් වන පෙර පැවති නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බද්ද 2019 අගෝස්තු 01 දින සිට 2020 ජනවාරි 31 දින දක්වා යළි ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, එ.ජ. ඩොලර් 60ක නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බද්ද 2020 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වේ. |
| 2019 ඔක්තෝබර් 23 | - | විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් (ණයපත් සහ හරපත්) භාවිතා කර, භාණ්ඩ හා සේවා මිල දී ගැනීම සඳහා විදේශයන්ට කරනු ලබන ගෙවීම් මත සියයට 3.5ක විදේශ වාණිජ ගනුදෙනු මත අය බද්ද පනවන ලදී. විදේශ වාණිජ ගනුදෙනු මත අය බද්ද ක්‍රියාත්මක වන දිනය මුදල් අමාත්‍යවරයා විසින් ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශ කරනු ඇත. |
| 2019 දෙසැම්බර් 01 | - | විදුලි සංදේශ බද්ද සියයට 15 සිට සියයට 11.25 දක්වා අඩු කරන ලදී. |
| 2020 ජනවාරි 01 | - | ණය ආපසු ගෙවීමේ බද්ද ඉවත් කරන ලදී. |
| 2020 මාර්තු 23 | - | 2020 පළමු කාර්තුවට අදාළව 2020 අප්‍රේල් 15 වන දිනට ගෙවීමට නියමිතව තිබූ මුද්දර ගාස්තු ගෙවීම් 2020 අප්‍රේල් 30 දින දක්වා සිදු කිරීමට අවසර ලබා දෙන ලදී. |

**වෙනත් ගාස්තු සහ අය කිරීම්**

| | | |
|---|---|---|
| 2019 ජුනි 01 | - | විදේශ ගමන් බලපත්‍ර සැකසුම් ගාස්තු පහත පරිදි ඉහළ නංවන ලදී. |

ඒකකයට රුපියල්

| වර්ගය | පැවති අගය | සංශෝධිත අගය |
|---|---|---|
| වෙනස් කිරීම් ගාස්තු | 500 | 1,000 |
| සැකසුම් ගාස්තු (හදිසි පදනම මත) | 10,000 | 15,000 |
| වයස අවුරුදු 16 ට අඩු දරුවන්ට වසර 3 ක් සඳහා | 5,000 | 7,500 |
| සැකසුම් ගාස්තු (සාමාන්‍ය පදනම මත) | 3,000 | 3,500 |
| වයස අවුරුදු 16 ට අඩු දරුවන්ට වසර 3 ක් සඳහා | 2,000 | 2,500 |

**රාජ්‍ය වියදම**

| | | |
|---|---|---|
| 2019 අප්‍රේල් 22 | - | රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා 2019 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 2,500 ක අන්තර් දීමනාවක් ලබා දීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2019 නිකුත් කරන ලදී. |
| 2019 මැයි 31 | - | 2019 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම යන අවස්ථාවේ දී විශ්‍රාමිකයා ලබා ගත් මූලික වැටුපට 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් මුල් අදියර දෙක ඇතුළත් වන පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම් සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2019 නිකුත් කරන ලදී. |
| 2019 ජුනි 17 | - | ප්‍රාග්ධන වියදම්වලින් සියයට 15ක් අඩු කිරීම සහ විශේෂයෙන්ම විදුලිය, දුරකථන සේවා, ජල සැපයුම, ඉන්ධන පරිභෝජනය හා ලිපිද්‍රව්‍ය මත වන පුනරාවර්තන වියදම් තාර්කිකරණය කිරීම සඳහා වියදම් දරන රාජ්‍ය ආයතනවලට උපදෙස් දීම සඳහා ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2019 නිකුත් කරන ලදී. |
| 2019 සැප්තැම්බර් 24 | - | ප්‍රමුඛ නොවන ව්‍යාපෘති, නව ව්‍යාපෘති සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනීම් කල් දැමීම මගින් ප්‍රාග්ධන වියදම්වලින් තවත් සියයට 10ක් අඩු කිරීම සඳහා වියදම් දරන රාජ්‍ය ආයතනවලට උපදෙස් දීම සඳහා ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2019 නිකුත් කරන ලදී. |
| 2019 දෙසැම්බර් 04 | - | අත්‍යවශ්‍ය නොවන හා ප්‍රමුඛ නොවන සියලුම වියදම් කපා හරින ලෙසට ජාතික අයවැය චක්‍රලේඛ අංක 07/2019 මගින් වියදම් දරන සියලුම රාජ්‍ය ආයතනවලට උපදෙස් ලබා දෙන ලදී. |

| | | |
|---|---|---|
| 2020 පෙබරවාරි 14 | - | ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් හා සහාය දීමට සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාව පිහිටුවන ලදී. |
| 2020 මාර්තු 30 | - | කොවිඩ්-19 ව්‍යාප්තියෙන් පීඩාවට පත් වූ අඩු ආදායම්ලාභී සහ ආර්ථික වශයෙන් ශක්තිමත් නොවන අවධානය ලැබිය යුතු පවුල් සහ පුද්ගලයින් (සමෘද්ධිලාභීන්, වැඩිහිටි පුද්ගලයන්, ආබාධිත පුද්ගලයන්, වකුගඩු රෝගීන් සහ ගොවි රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි ගොවීන්) සඳහා රජය විසින් රුපියල් 5,000 ක එකවර සිදු කරන ගෙවීමක් හඳුන්වා දෙන ලදී. |

**රාජ්‍ය ණය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2019 ජනවාරි 27 | - | භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශ ආයෝජන සීමාව, පවත්නා මුළු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙන් සියයට 10 සිට සියයට 5 දක්වා අඩු කිරීම. |
| 2019 මාර්තු 25 | - | ලංකාසෙක්‍යු පද්ධතියෙහි පවතින සුරැකුම්පත් ගිණුම්වල සිදුකෙරෙන සෑම නිර්ලේඛිත සුරැකුම්පත් හර සහ බැර සටහනක් සඳහාම කෙටි පණිවුඩයක් හරහා සහ/හෝ විද්‍යුත් තැපැල හරහා ලංකාසෙක්‍යු පද්ධතියෙහි ගනුදෙනුකරුවන් හට තත්කාලීනව දැනුම්දීමේ සේවාව ආරම්භ කරන ලදී. |
| 2019 අප්‍රේල් 11 | - | මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව විසින් සම්පාදනය කළ, 2019-2023 කාලපරිච්ඡේදය සඳහා වන මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2019 ජූලි 09 | - | 2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ රුපියල් බිලියන 480ක් නොඉක්ම වූ මුදලක් ණය වශයෙන් ලබා ගැනීමට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මත කරන ලදී. |
| 2019 ඔක්තෝබර් 01 | - | 2020 ජනවාරි 01 දින සිට ලංකාසෙක්‍යු පද්ධතියේ සිදු කෙරෙන සෑම සුරැකුම්පත් ගනුදෙනුවකටම අදාළ පියවීම් වටිනාකම, මිල සහ පොලී අනුපාතිකය වාර්තා කිරීම සිදු කෙරෙන අතර, ඒ සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් දැනුම්වත් කරමින් සහ ඊට අනුකූල වන ලෙස දන්වා 2019 ඔක්තෝබර් 01 වන දින චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

**අනෙකුත්**

| | | |
|---|---|---|
| 2019 පෙබරවාරි 14 | - | 2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසීන්හි නිළධාරින්ගේ යථා යෝග්‍යතාවයේ අවශ්‍යතාව, මුදල් තැරැව්කරණ ව්‍යාපාරයන්හි පාලනයන් අත්කර ගැනීමේ සීමා, අභ්‍යන්තර පාලනය, වාර්තා කිරීමේ අවශ්‍යතාවන් සහ ගිණුම් හා අනෙකුත් වාර්තා පරීක්ෂා කිරීම ආදිය ශක්තිමත් කර සංශෝධනය කරමින් 2019 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කරන ලදී. |